## 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 01 හි 70 වගන්තියට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම හා ජංගම නොවන වත්කම් සහ ජංගම හා ජංගම නොවන බැරකම් ද්‍රවශීලතාවය පදනම් කරගෙන මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කල යුතු වුව ද එලෙස ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 70 වන වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම හා ජංගම නොවන වත්කම් ද්‍රවශීලතාවය පදනම් කරගෙන මුහුණතෙහි වෙනමම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කරන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 07 අනුව ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම වෙන වෙනම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණු අතර ඉඩම් ක්ෂය නොකළ යුතු වුවද සියයට 5 ක ක්ෂය වෙන් කිරීම් සිදු කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2015 වර්ෂයේ දී ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව තක්සේරු කිරීම සිදු කර ගනු ලැබූ අතර ඒ සඳහා ගෙවියයුතු තක්සේරු ගාස්තු ගෙවා එකී වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව 2019 වර්ෂයේ සිට ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව සටහන් කරන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමිත අංක 07 හි 08 වන වගන්තිය ප්‍රකාරව කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමින් යුත් පාරිම්පරික වත්කම් පිළිබඳ මුල්‍ය ප්‍රකාශන මගින් හෙළි දරව් කල යුතු වුව ද එලෙස කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය විද්වත් ආයතන දෙකක් වන ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු පැමිණ අවශ්‍යය උපදෙස් ලබා දී ඇති බවත් ඒ අනුව ලබා දුන් වාචික උපදෙස් මත අවශ්‍යය කටයුතු සිදු කරමින් පවතින බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යස්ථානය විසින් 1998 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමැති අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000 ක් ආයෝජනය කර එම සමාගම 2008 වර්ෂයේදී වසා දමා තිබුණු අතර එම ආයෝජන මුදලින් රු.700,000 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. එම ආයතනය වසා දමා වසර 10 ක් ගත වී ඇතත් අයකර ගත නොහැකි රු.4,300,000 ක ශේෂය තවදුරටත් දීර්ඝ කාලින ආයෝජන ලෙස දක්වා තිබුණි. | මෙම අයෝජනය දිගුකාලීන ආයෝජන තුලින් ඉවත් කිරීම සඳහා 2015 වර්ෂයේ දෙසැම්බර් මස 15 වන දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බවත් අදාල ආයෝජන මුදල ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීම් යොමු කර ඇති අතර අදාල අනුමැතිය ලද පසු ගිණුම් තුලින් ඉවත් කරන බව. | අයකර ගත නොහැකි ආයෝජනයක් නිසා භාණ්ඩාගාර අනුමැතිය මත ඉදිරි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිත වෙන් කිරීම් ශේෂය රු.66,540 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පාරිතෝෂිත දීමනාව ගණනය කිරීමේ දී සිදු වී ඇති ගණනය කිරීමේ දෝෂයක් නිසා පාරිතෝෂිත දීමනා වෙන් කිරීම අඩුවෙන් ගණනය වී ඇති අතර 2019 වර්ෂයේ ගිණුම් තුලින් මෙම ගණනය කිරීමේ දෝෂය නිවැරදි කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 01 දිනට සංචිත හා රඳවා ගත් ලාභ ශේෂය රු.47,137,918 ක් වුවද හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයෙහි එම ශේෂය රු.37,590,294 ක් ලෙස රු.9,547,624 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වෙනස ඇති වී තිබෙනුයේ ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානය විසින් ආරම්භයේ සිටම වාර්ෂික ශුද්ධ ලාභය සංචිත හා රඳවා ගැනීමේ ගිණුමට මාරු කොට නොතිබීම වන අතර ඉදිරියේ දී අදාල ශුද්ධ ලාභයන් සංචිත හා රඳවා ගැනීමේ ගිණුමට මාරු කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය රු.58,313,923 ක් වුවද හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයට සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව එම ශේෂය රු.62,644,270 ක් ලෙස රු.4,330,347 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ සංචිත හා රඳවා ගැනීමේ ශේෂය අඩුවෙන් සටහන් වී තිබෙනුයේ පසු ගිය වර්ෂයන්හි ශුද්ධ ලාභය එයට ගලපා නොතිබිම බවත් 2019 වර්ෂයේ අවසාන ගිණුම්තුලින් මෙම සටහන් කිරීමේ දෝෂය නිවැරදි කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් අයිතම 09 ක් | රු. රු.56,250,416 | අයිතිය හා නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට අදාළ ලේඛන | ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය ආරම්භයේ සිටම සකස් කරනු ලබන අවසාන ගිණුම් ප්‍රකාශ පදනම් කොට ගනිමින් මෙම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශතුල හෙළිදරව් කර ඇති බව. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගොඩනැගිලි කුලියට ගත් ආයතන වෙනුවෙන් විදුලි වියදම් ලෙස ගෙවූ රු.646,518 ක මුදලක් ආයතනයට අයවිය යුතුව තිබුණි. | ලැබිය යුතු විදුලි ගාස්තු ගෙවන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇති බව. | අයකර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.107,109 ක් වූ ලැබිය යුතු ශේෂ 05 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයේ සිට මෙම ලැබිය 2002 යුතු ශේෂයන් ගිණුම් ප්‍රකාශයන් තුල අන්තර්ගත වන අතර මේ සම්බන්ධයෙන් අදාල තොරතුරු සොයා ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් ඉදිරියේ දී පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම ලැබියයුතු ශේෂයන් ගිණුම් තුලින් කපා හැරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.272,221 ක් වූ ගෙවිය යුතු ශේෂ 05 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2002 වර්ෂයේ සිට ගෙවිය යුතු මෙම ශේෂයන් ගිණුම් ප්‍රකාශන තුළ අන්තර්ගත වන අතර මේ සම්බන්ධයෙන් අදාල තොරතුරු සොයා ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් ඉදිරියේ දී පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම ගෙවියයුතු ශේෂයන් ගිණුම් තුලින් කපා හැරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 133 | මධ්‍යස්ථානයේ මුදල් කටයුතු පිළිබඳව අභ්‍යන්තර පාලනය ඇති කිරීම සඳහාත් එම කටයුතු වල වැරදි හා වංචා වැලක්වීමට සහ අනාවරණය කරගැනීමට ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම සඳහාත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගත යුතු වුවත් මධ්‍යස්ථානය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂිකව අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 135 | විධිමත් පරිදි මූල්‍ය බලතල පවරා නොතිබුණි. | මූල්‍ය බලතල බෙදාහැරීමේ අධිකාරි බලය සම්බන්ධයෙන් ලේඛණයක් සකස්කොට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව. | විධිමත් පරිදි මූල්‍ය බලතල පැවරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 802 (1) | වාහන සපයනු ලැබ ඇති ආයතන වල ප්‍රධානීන් ඒවා පමණට වැඩි නොවන බවටත් නිෂ්ක්‍රියව නොතිබෙන බවටත් වග බලා ගත යුතු වුව ද මධ්‍යස්ථානය විසින් 2013 වර්ෂයේදී රු.309,120 කට මිල දී ගත් යතුරු පැදියක් 2015 වර්ෂයේ සිට භාවිතයට නොගෙන අනාරක්ෂිත පරිදි ගාල් කර තිබුණි. | යතුරු පැදි දෙකෙන් එකක් තක්සේරු කොට විකිනිම සඳහා මධ්‍යස්ථානය විසින් තීරණය කර ඇති බවත් මේ වන විට යතුරු පැදි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ඇති අතර ඉදිරියේ දී මින් එක් යතුරු පැදියක් විකිනීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) xix පරිච්ඡේදයේ 5.8 වගන්තිය | නිල නිවසක් භාවිත කරන නිලධාරියකු එම නිවසට අයත්, ජලය සහ විදුලි බලය සඳහා දරන වියදම් අදාල නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ලේකම් ජනරාල්වරයාගේ නිල නිවසේ විදුලි බිල සඳහා රු.192,645 ක් ද ජල බිල සඳහා රු.12,000 ක් ද මධ්‍යස්ථානය විසින් ගෙවා තිබුණි. | නිල නිවස සහ ආයතන පරිශ්‍රයේ ගොඩනැගිලි සඳහා පරිභෝජනය කරනු ලබන ජල ඒකක ප්‍රමාණය සහ විදුලි ඒකක ප්‍රමාණය වෙන් වෙන්ව ගණනය කිරීමේ හැකියාවක් නොපවතින බවත් ලේකම් ජනරාල් තනතුර යනු ආයතනයේ වැටුප් නොලබන දීමනාවක් පමණක් ලබා දෙන තනතුරක් වන බව. | නිල නිවසට අදාල විදුලිය සහ ජල බිල් අදාල නිලධාරියා විසින් දැරිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) xix පරිච්ඡේදයේ 08 වන වගන්තිය | නිල නිවස සඳහා වෙනම ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන යා යුතු නමුත් ලේකම් ජනරාල් වෙනුවෙන් ආයතන පරිශ්‍රයේ පවතින නිල නිවස සම්බන්ධයෙන් එවැනි ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේ දී නිල නිවස සඳහා වෙනම ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | නිල නිවස සඳහා වෙනම ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | 1988 අංක 77 දරන ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 4 (I) ඇ වගන්තිය | 1996 වර්ෂයේ සිට මධ්‍යස්ථානයට ලැබී තිබූ Umatics හා අනෙකුත් ශ්‍රව්‍ය දෘශ්‍ය දත්ත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ආයතනයේ වගකීමක් වුවත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුන් මේ වන විට ආරක්ෂිතව අසුරා තබා ඇති බව සහ කඩිනමින් සංරක්ෂණ කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ | පාලක මණ්ඩල අනුමැතියකින් තොරව ප්‍රසාද දීමනා වෙනුවෙන් රු.942,083 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | ප්‍රසාද දීමනා ගෙවීමට අදාල පාලක මණ්ඩල අනුමැතිය ඉදිරියේ දී පැවැත්වෙන පාලක මණ්ඩල රැස්වීමකට ඉදිරිපත් කොට ආවරන අනුමැතිය ලබා ගන්නා බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | 2015 ජූලි 06 දිනැති ආදායම් බදු කොමසාරිස් ජනරාල්ගේ අංක SEC/2015/15 දරන | දෙවන සේවා යෝජකත්වය යටතේ ලේකම් ජනරාල්වරයාගෙන් රු.202,990 ක් ද | ඉදිරියේ දී උපයනවිට බදු ගෙවීම සම්බන්ධයෙන් ලේඛණයක් සකස් කිරීමටත් මාසික | උපයන විට බදු විධිමත් පරිදි අයකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය සහ 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/60 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | මහාචාර්යවරයාගෙන් රු.32,972 ක් ද වශයෙන් උපයන විට ගෙවීමේ බදු අයකර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබීම නිසා ගෙවීමට සිදු වන දඩ සහ පොලී රු.40,339 ක් විය. | ඉපයීම රු.100,000 ඉක්මවන අවස්ථාවන් සඳහා පමණක් උපයන විට බදු කොටස් වශයෙන් අයකර ගැනීමටත් කටයුතු කරන බව. | කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක PED/01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 වගන්තිය | නිල වාහන හිමි නිලධාරින්ගේ පෞද්ගලික ගමන් සඳහා රියදුරන්ට ගෙවන අතිකාල හා අනෙකුත් ඒකාබද්ධ දීමනා අදාළ නිල වාහනය හිමි නිලධාරියා විසින් දැරිය යුතු වුව ද ඊට පටහැනිව ලේකම් ජනරාල්වරයාගේ පෞද්ගලික ගමන් සඳහා අතිකාල දීමනා ලෙස රු.276,713 ක් රියදුරන් වෙත මධ්‍යස්ථානය විසින් ගෙවා තිබුණි. | ඉන්ධන වියදම ගණනය කිරීම අපැහැදිලි බව | චක්‍රලේඛ ප්‍රකාරව පෞද්ගලික ගමන් සඳහා රියදුරන්ට ගෙවන අතිකාල දීමනා නිලධාරියා විසින් දැරිය යුතුය. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 4.2.2 ඡේදය සහ 4.2.3 ඡේදය | මාසික මූල්‍ය ප්‍රකාශන සෑම මසකම පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර මාස 06 කට වරක් කාර්යසාධන වාර්තා සාකච්ඡාකිරීම | අතිගරු ජනාධිපතිතුමා අග්‍රාමාත්‍යතුමා කථානායකතුමා විපක්ෂ නායකතුමා ඇතුළු ශ්‍රී ලංකාවේ | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | හා එහි වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | පරිපාලන ව්‍යුහය තුල සිටින අතිශය කාර්යබහුල පිරිසකගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පවතින හෙයින් පාලක මණ්ඩල රැස්වීමක් 2018 ජනවාරි 01 දින සිට 2019 පෙබරවාරි 28 දින දක්වා වූ කාල පරාසය තුල දී පැවැත්වීමට හැකියාව නොලද නිසා මාසික මූල්‍ය ප්‍රකාශන සහ කාර්යය සාධන වාර්තා සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බව. | |
| (ඖ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය | මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,176,004 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,756,476 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.419,520 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කුලී ආදායම රු.686,420 කින් ද ශාලා ගාස්තු ආදායම රු.2,218,393 කින් ද වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2017 වර්ෂයේ රු.21,501,556 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් 2018 වර්ෂයේ රු.22,187,976 ක් දක්වා සියයට 03 කින් වැඩිවී තිබුණු අතර 2017 වර්ෂයේ රු.12,231,102 ක් වූ ශාලා ගාස්තු ආදායම 2018 වර්ෂයේදී 14,449,495 ක් දක්වා සියයට 18 කින් වැඩි වී තිබුණි. එසේම 2017 වර්ෂයේ රු.358,000 ක් වූ පිරිසිදු කිරීමේ වියදම් 2018 වර්ෂයේදී රු.1,165,780 ක් දක්වා සියයට 225 කින් වැඩි වී තිබුණු අතර 2017 වර්ෂයේ රු.1,824,225 ක් වූ ආරක්ෂක වියදම් 2018 වර්ෂයේදී රු.2,144,350 ක් දක්වා සියයට 17 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

මධ්‍යස්ථානයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 7.1:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 7.6:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 6.9:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 7.4:1 ක් විය. ජංගම වත්කම් වලින් සියයට 76 ක් කෙටිකාලීන ආයෝජන නියෝජනය කරන අතර ඒ අනුව මධ්‍යස්ථානයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යස්ථානය විසින් 2002 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු.9,725,000 ක් ආයෝජනය කර තිබුණු අතර එම බැංකුව වගකිම් පැහැර හැරීම හේතුවෙන් මහ බැංකුව විසින් තැන්පත් කරුවන්ගේ වගකීම් පෞද්ගලික බැංකුවක් මගින් පියවීමේ යෝජනා ක්‍රමයක් සකසා තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2007 දෙසැම්බර් 03 දින පළ කර | ප්‍රමුඛ බැංකුව බුන්වත් වීම නිසා එහි ස්ථාවර තැන්පතු තුල ආයෝජනය කොට තිබූ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ණයකර තුල ආයෝජනය කරන ලද බවත් එම මුදල් ආයෝජනය කල දිනයේ සිට වර්ෂ 2 ක් ඒ සදහා පොලී නොලැබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශ කරන ලද නිසා විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට අදාල ණයකර | ආයෝජන තීරණ ගැනීමේදී මධ්‍යස්ථානයට වඩාත් වාසිදායක වන ලෙස තීරණ ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණු පුවත් පත් දැන්වීමේ 02(අ)ජේදය අනුව පුවත් පත් වල පළ කරනු ලැබූ මුල් දිනයේ සිට වසර 02 ක් ඉක්ම යන දිනය දක්වා කාල සීමාව සඳහා ආයෝජන වෙනුවෙන් පොලී එකතු කිරීමක් හෝ පොලී ගෙවීමක් නොකරන බව දන්වා තිබුණි. ඒ අනුව මෙම ආයෝජන තීරණය හේතුවෙන් රු.972,500 ක පාඩුවක් සිදු වී තිබුණි. | සඳහා වර්ෂ 2 ක පොලිය අහිමි වී ඇති බව | |
| (ආ) භාණ්ඩ සමීක්ෂණය සිදු කල 2018 ජුනි 30 දිනට පොත් 708 ක ප්‍රමාණයක් පරිග්‍රහණ ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබූ අතර පරිග්‍රහණ ලේඛනයේ ඇතුලත් පොත් 210 ක ප්‍රමාණයක් අස්ථාන ගත වී තිබුණි. | මෙම පොත් පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කිරීමට පෙර ඒවා තේරීමකට ලක් කර අනවශ්‍ය දෑ ඉවත් කිරීමක් කළ යුතු අතර පුස්තකාල උපදේශන කමිටුවක උපදෙස් මත කටයුතු කිරීම කළ යුතු බැවින් එය සිදු කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී මේ සම්බන්ධව ක්‍රියාත්මක වීමට නියමිත බව. | විධිමත් පරිදි පුස්තකාල පොත් පරිග්‍රහන ලේඛනයේ ඇතුලත් කර ආරක්ෂිතව ගබඩා කල යුතුය. |
| (ඇ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ඉතා ඉහල වර්තමාන වෙළඳපල මිලක් සහිත වූ භූමියක පිහිටි විවිධ ප්‍රමාණයකින් යුත් කාර්යාල පරිශ්‍ර 12 ක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමකින් තොරව මාසික අවම මිලකට කුලියට ලබාදී තිබුණි. | ඉදිරියේ දී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරු වාර්තාවක් ලබා ගෙන වර්ග අඩියක් සඳහා අය කරනු ලබන කුලී මුදල සංශෝධනය කිරීමට අපේක්ෂිත බව. | වර්තමාන තක්සේරු වටිනාකම් පදනම් කර ගනිමින් කුලී ගාස්තු නියම කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)මධ්‍යස්ථානය විසින් මාස 01 සිට මාස 07 දක්වා වූ කෙටිකාලයක් සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව පාර්ශව 04 කට ගොඩනැගිලි කුලියට ලබා දී තිබුණි. මෙම පාර්ශවයන් අතුරින් පාර්ශව දෙකකගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.148,794 ක කුලී මුදලක් අයවීමට තිබූ නමුත් වලංගු ගිවිසුමක් නොමැතිවීම නිසා එම මුදල් අයකර ගැනීමේදී ගැටලුකාරී වී තිබුණි. | සයන්ස් ඇරීනා ආයතනය සහ ජේ එච් එල් සී පෙරේරා සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට ඇති අතර ඉදිරියේ දී අදාල ආයතන සමග බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුල රැස්වී නොතිබුණු බැවින් 2018 වර්ෂයේ අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම අනුමත වී නොතිබුණි. | අතිගරු ජනාධිපතිතුමා අග්‍රාමාත්‍යතුමා කථානායකතුමා විපක්ෂ නායකතුමා ඇතුළු ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය තුල සිටින අතිශය කාර්යබහුල පිරිසකගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පවතින හෙයින් පාලක මණ්ඩල රැස්වීමක් 2018 ජනවාරි 01 දින සිට 2019 පෙබරවාරි 28 දින දක්වා වූ කාල පරාසය තුල දී පැවැත්වීමට හැකියාව නොලද නිසා 2018 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛණය සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ අතර ඉදිරියේ දී පැවැත්වෙන පාලක සභා රැස්වීමේ දී මේ සඳහා අවශ්‍යය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.10,100,000 ක් වටිනා ඉලක්කගත කාර්යයන් 29 න් රු.8,885,000 ක ඇස්තමේන්තු ගත වටිනාකමින් යුත් කාර්යයන් 24 ක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉටු නොකළ කාර්යයන් 24 න් 19 ක්ම 2016 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කළ කාර්යයන් බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ සලකා බැලීමේදී පුරප්පාඩු 13 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට බඳවා ගැනිමේ පටිපාටියට අනුකූලව පුරප්පාඩුව පවතින තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන බව. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේ 2019 මැයි 10 දින දීය. | ඉදිරියේ දී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කල යුතුය |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ගත වටිනාකම් සහ සත්‍ය වටිනාකම් අතර සියයට 30 සිට සියයට 633 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කරන ලද්දේ 2017 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී වන අතර, අදාල අපේක්ෂිත වියදම් ඇස්තමේන්තු කිරීමේදී අපේක්ෂා නොකල වියදම් 2018 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු කිරීමේදී ඇති වූ නිසා විගණනය විසින් පෙන්වා දී ඇති වියදම් දැරීමට සිදු වූ බව. | අයවැය සකස් කිරීමේදී වාර්ෂිකව ඉටුකල යුතු ප්‍රමුඛතා නිශ්චිතව හඳුනා ගත යුතු අතර අපේක්ෂිත පරිදි එම කාල වකවානු තුළ ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |